# විෂය

## බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 8.0

**ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.**

# නිපුණතා මට්ටම - 11.8.1

**බෞද්ධ ථෙරවාදී සංගායනා අධ්‍යයනය කොට ථෙරවාද සම්ප්‍රදාය රැක ගැනීමට දායකවෙයි.**

# පාඩම

## 16 නිමල දහම රැකුණු අයුරු



සැකසුම - වයි. පී. පී කවිසිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

1. “ආනන්දය මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද නම් විනයක් පනවන ලද නම් ඒ ධර්මය හා විනය මාගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේ යැයි” මෙම ප්‍රකාශය සඳහන් සූත්‍ර දේශනාව නම් කරන්න.
2. “බුදු දහම අනාගතයට තිළිණ කිරීම සඳහා ශාසන ඉතිහාසය ගෙන ඇති හොඳම පියවර වනුයේ ධර්ම සංගායනා පැවැත්වීමයි” මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රථම ධර්ම සංගායනාව | දෙවන ධර්ම සංගායනාව | තෙවන ධර්ම සංගායනාව | සිව්වන ධර්ම සංගායනාව |
|---|---|---|---|---|
| පවත්වන ලද්දේ බුද්ධ පරිනිර්වාණයෙන් | | | | |
| ප්‍රධාන හේතුව | | | | |
| මූලිකත්වය | | | | |
| දායකත්වය | | | | |
| ස්ථානය | | | | |
| සහාය වූ පිරිස | | | | |
| ගත වූ කාලය | | | | |
| සහභාගි වූ ප්‍රමාණය හා සංගායනාව හැඳින්වෙන නාමය | | | | |
| ප්‍රතිඵල | | | | |

3. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ඒ ඒ ධර්ම කොටස් මුඛ පරම්පරාගතව ඉදිරියට ගෙන ඒම සඳහා භාණක පරම්පරාවලට පැවරීම සිදු විය. ඒ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| සූත්‍ර ධර්ම නිකාය වශයෙන් | භාණක පරපුර |
|---|---|
| 1. දීඝ නිකාය | |
| 2. මජ්ඣිම නිකාය | |
| 3. අංගුත්තර නිකාය | |
| 4. සංයුක්ත නිකාය | |
| 5. ඛුද්දක නිකාය | |

4. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ලියා දක්වන්න.

5. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙන හැර දක්වන්න.

6. ධර්මාශෝක රජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව ථෙරවාදී බුදුදහම දේශ දේශාන්තරවල ව්‍යාප්ත කිරීම හා සම්බන්ධව පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රදේශය | නායකත්වය | ප්‍රථමයෙන් දේශනා කරන ලද සූත්‍රය හෝ කථා වස්තුව |
|---|---|---|---|
| 1 | කාශ්මීර ගන්ධාරය | | |
| 2 | මහිස මණ්ඩලය | | |
| 3 | වනවාසී දේශය | | |
| 4 | අපරන්ත දේශය | | |
| 5 | මහාරට්ඨ | | |
| 6 | යෝනක රට්ඨ | | |
| 7 | හිමවන්ත ප්‍රදේශය | | |
| 8 | ස්වර්ණභූමිය | | |
| 9 | තම්බපණ්ණිය (ශ්‍රී ලංකාව) | | |

7. අභිධර්ම පිටකයට අයත් ප්‍රකරණ හත (සප්ත ප්‍රකරණය) නම් කරන්න.

8. සිව්වන ථෙරවාද සංගායනාවේ ප්‍රතිඵල ලියා දක්වන්න.

# විෂය

බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 8.0

ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

# නිපුණතා මට්ටම - 11.8.2

මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වූ ආකාරය අගයමින් සරල හා දැහැමි දිවි පෙවෙතකට හුරු වෙයි.

# පාඩම 17

මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වූ ආකාරය

1. මහින්දාගමනය සිදු වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර කියකට පසුව ද?

2. මහින්දාගමනය සිදුවන විට ලක්දිව හා දඹදිව රාජ්‍ය පාලනය කළ පාලකයන් දෙදෙනාගේ නම් ලියන්න.

3. දූමින්දාගමනය යන්නෙන් අදහස් කරන ලද්දදේ කුමක්ද යන්න පැහැදිලි කරන්න.

4. ලක්දිව පැවිදි බවට පත් මුල්ම රාජකීය කාන්තාවගේ නම ලියන්න.

5. ලක්දිව ප්‍රථම ථෙරවාද බෞද්ධ මූලස්ථානයේ නම ලියන්න .

6. ලක්දිව බුදුදහම ප්‍රතිස්ඨාපනය වීම සඳහා මෙරට උපන් කුල කුමරකු පැවිදි කළ යුතු විය. එසේ පැවිදි වූ කුමාරයාගේ නම ලියන්න.

7. සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ ලක්දිව ආගමනයෙහි ප්‍රධාන අරමුණ කුමක් ද?

8. සිංහල අක්ෂර මාලාව සකස් කර ගැනීම සඳහා ආදාර්ශ කොටගෙන ඇති අක්ෂර හඳුන්වන නම ලියා දක්වන්න.

9. දූමින්දාගමනයෙන් අප ලත් දායාද දෙකක් නම් කරන්න.

10. මහින්දාගමනයෙන් ලත් දායාද පහක් නම් කරන්න.

# විෂය

බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 8.0

ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

# නිපුණතා මට්ටම - 11.8.3

ශාසන ඉතිහාසයෙන් උරුම වූ මූර්ති හා චිත්‍ර අගයමින් සංරක්ෂණය කිරීමට දායක වෙයි.

# පාඩම 18

හෙළ බොදු කලාවේ අසිරිය

1. බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර බුදුරජාණන් වහන්සේ වෙනුවට වන්දනාමාන කළ සංකේත පහක් නම් කරන්න.

2. ආබද්ධ පිළිම හා අනාබද්ධ පිළිම යන සංකල්ප උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

3. බුදු පිළිමවල දැකිය හැකි මුද්‍රා පිළිබඳ හැඳින්වීමක් කරන්න.

4. බුද්ධ ප්‍රතිමා නිර්මානයේදි දක්නට ලැබෙන ආසන පිළිබඳ හැඳින්වීමක් කරන්න.

5. ප්‍රතිමාංසර වර්ග තුනක් නම් කර ඉන් එකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

6. මහනුවර යුගයේ චිත්‍ර දැකිය හැකි ස්ථාන හතරක් නම් කරන්න.

7. මහනුවර යුගයේ සිටි චිත්‍ර ශිල්පීන් තිදෙනෙකුගේ නම් ලියන්න.

8. මහනුවර යුගයේ චිත්‍රවල දැකිය හැකි අනන්‍යතා ලක්ෂණ පැහැදිලි කරන්න.

9. නූතන යුගයේ චිත්‍ර ශිල්පීන් තිදෙනෙකුගේ නම් ලියන්න.

10. සේදවත්තේ වෙහෙරගොඩැල්ල විහාරයේ චිත්‍ර අඳින ලද ශිල්පියාගේ නම ලියන්න.

11. බොරැල්ලේ ගෝතමී විහාරයේ චිත්‍ර අඳින ලද ශිල්පියාගේ නම ලියන්න.

12. සෝලියස් මෙන්දිස් මහතා විසින් චිත්‍ර අඳින ලද ස්ථාන හතරක් නම් කර දක්වන්න.



සැකසුම - වයි. පී. පී කවිසිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

# විෂය

බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 8.0

ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

# නිපුණතා මට්ටම - 11.8.4

බුදු දහම ඇසුරින් පෝෂණය වූ සිංහල සාහිත්‍යය රසාස්වාදනය කරමින් එහි සංරක්ෂණයට දායක වෙයි

# පාඩම 19

බුදු සමයෙන් පෝෂණය වූ සිංහල සාහිත්‍යය

1. ඡන්දස් අලංකාරය පිළිබඳ විස්තර කරන දඹදෙණිය සාහිත්‍ය යුගයේ රචනා වූ ග්‍රන්ථයේ නම ලියන්න.

2. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

3. පාලි බෝධිවංසයෙහි සිංහලට පරිවර්තනය කර රචනා කරන ලද ග්‍රන්ථයේ නම ලියන්න.

4. ථූපවංසය නැමැති ග්‍රන්ථය රචනා කරන ලද කතුවරයාගේ නම ලියන්න.

5. ගම්පොළ සාහිත්‍ය යුගයේ රචනා කරන ලද සංදේශ කෘති දෙකක නම් ලියන්න.

6. නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය රචනා කරන ලද කතෘවරයාගේ නම ලියන්න.

7. කෝට්ටේ යුගයේ වැඩ සිටි ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ පහක නම් ලියා දක්වන්න.

8. කෝට්ටේ යුගයේ වැඩ සිටි වීදාගම මෛත්‍රේය නාහිමිපාණන් වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

# විෂය

බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 9.0

බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.

# නිපුණතා මට්ටම - 11.9.1

රැකියා නියුක්තියේ දී හා මුදල් පරිහරණයේ දී ධාර්මික ක්‍රමෝපායයන් පිළිබඳ මූලික හුරුව ලබයි.

# පාඩම 20

දැහැමි ධනය ගෙනෙයි සැපය

1. “අනවජ්ජානි කම්මානි” යන පාඨයෙහි අර්ථය ලියා දක්වන්න.

2. බුදු දහමෙහි සඳහන් නිවැරදි කර්මාන්ත (රැකියා) පහක් ලියා දක්වන්න.

3. වෙළඳාමේ සිදු කරන අධාර්මික ක්‍රියා තුනක් ලියන්න.

4. බුදු දහමෙහි දක්වා ඇති නො කළයුතු වෙළෙඳාම් පහ නම් කරන්න.

5. අනණ සූත්‍රයේ සඳහන් චතුර්විධ සැපය හඳුන්වන්න.

6. බුදුරජාණන් වහන්සේ දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කළ මෙලොව දියුණුවට හේතු වන කරුණු හතර නම් කරන්න.

7. “නිබ්බාණ පරමං සුඛං” පාඨයේ තේරුම ලියන්න.

# විෂය

බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 9.0

බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.

# නිපුණතා මට්ටම - 11.9.2

උපයා ගත් ධනය තමාගේ හා අන්‍යයන්ගේ යහපත පිණිස යෙදවිය යුතු බව දැන ඊට අනුගතව ක්‍රියා කරයි.

# පාඩම 21

දැහැමි ව උපයා දැහැමි ව වැය කරමු

1. බුදුරජාණන් වහන්සේ පත්තකම්ම සූත්‍රය දේශනා කරන ලද්දේ කවුරුන් උදෙසා ද?

2. පත්තකම්ම යන්නෙහි අර්ථය ලියන්න.

3. පත්තකම්ම සූත්‍රයෙහි සඳහන් ප්‍රාප්ත කර්ම හතර ලියා දක්වන්න

4. පංච බලි අර්ථ සහිතව ලියා දක්වන්න.

5. "දානඤ්ච ධම්ම චරියාච
ඤාතකානඤ්ච සංඝහෝ
අනවජ්ජානි කම්මානි
ඒතං මංගල මුත්තමං" මෙම ගාථාවේ සඳහන් මංගල කරුණු ලියා දක්වන්න

# විෂය

බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 9.0

බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.

# නිපුණතා මට්ටම - 11.9.3

බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අධ්‍යයනය කොට තම ජීවිතයේ නායකත්ව අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දෙයි.

# පාඩම 22

පාලකයනට මග කියන බුදු දහම

1. දස රාජ ධර්ම යන්න කෙටියෙන් හඳුන්වන්න

2. දසරාජ ධර්ම නම් කරන්න.

.3. සීලය බෙදා දක්වන ප්‍රධාන අංශ දෙක නම් කරන්න.

4. යහපත් රාජ්‍ය පාලන මූලධර්මයක් ලෙස පංච සීල ප්‍රතිපත්තිය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

5. සිව් බඹ විහරණ හඳුන්වන වෙනත් නමක් ලියා දක්වන්න.

6. **සිව්බඹ** විහරණ නම් කරන්න.

7. යහපත් රාජ්‍ය පාලනයක් උදෙසා සිව්බඹ විහරණ උපයෝගීවන ආකාරය පැහැදිලි කරන්න.

# විෂය

බුද්ධ ධර්මය

# 11 - ශ්‍රේණිය

# නිපුණතාව - 10.0

නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

# නිපුණතා මට්ටම - 11.10.1

නිර්වාණගාමී ප්‍රතිපදාවේ සුවිශේෂත්වය තේරුම් ගෙන එම ප්‍රතිපදාවේ නියැලෙයි.

# පාඩම 23

ලොව්තුරු සුවේ පදනම සම්මා දිට්ඨියයි

1. බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතනයේ මිගදායේ දී පස්වග මහණුන් උදෙසා දෙසූ ප්‍රථම ධර්ම සූත්‍ර දේශනාවේ නම ලියන්න .

2. ත්‍රිවිධ ශික්ෂා නම් කරන්න.

3. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රි ශික්ෂාව අනුව බෙදා දක්වන්න.

4. අටුවාවල දක්වා ඇති ආකාරයට පස් ආකාර වූ සම්මා දිට්ඨිය අර්ථ සහිතව නම් කරන්න.

5. සම්මා සංකප්ප අයත් කොටස් තුන අර්ථ සහිතව ලියා දක්වන්න.

6. සම්මා කම්මන්තයට අයත් කොටස් තුන නම් කරන්න.

7. "ආජීව පාරිශුද්ධි" ශීලය යන්න පැහැදිලි කරන්න.

8. "සම්මා ආජීවය" යන්න පැහැදිලි කරන්න.

9. "සම්මා වායාම" අංගයට අයත් කොටස් හතර නම් කරන්න.

10. සතර සතිපට්ඨාන නම් කරන්න.

11. පුද්ගලයා කුසල් අරමුණක සිහිය පිහිටුවා ගන්නා ආකාරය පැහැදිලි කරන සූත්‍ර දේශනා තුනක් ලියා දක්වන්න.